"අයියෝ නිමන්ත.. ඔයා කොහෙද ඉතින් ආටිස්ට් කෙනෙක් ගැන දන්නෙ.. ක්‍රිකටර් කෙනෙක් හරි ඇක්ට්‍රස් කෙනෙක් හරි ගැන ඇහුවනම් ඉතිහාසෙ ඉඳන්ම කියයි.." අමන්දි නෝක්කාඩු බැල්මක් හෙලුවා ය. ".. විශ්වජිත් බණ්ඩාර කියන්නේ අද ලංකාවෙ ඉන්න හොඳම චිත්‍ර ශිල්පියෙක්.. නම්බර් වන්.. ඉන්ටනැෂනල් මට්ටමේ තියන්න පුලුවන් ශ්‍රී ලන්කන් ආටිස්ට්ල අතරින් කෙනෙක්.."

නිමන්ත සිනාසුණෝ ය.

"මටත් එක්කම ඔයා දන්නවනේ.." ඔහු කීවේ ය. ".. ඉතින් ඔයාගෙ මේ අති දක්ෂ චිත්‍ර ශිල්පියා එක්ක ඔයා කතා කළේ නැද්ද..?

"මං කතා කරන්න ආසාවෙන් හිටියෙ.. ඒත් එයා එතන හිටියෙ නැහැ.. අපරාදෙ.. හිටිය නම් මං වචනයක් හරි කතා කරනවා."

"...මම හෙට ඔයාට පේන්ටින්ග්ස් ගැන ලියවෙච්ච පොත් ටිකක් ගෙනත් දෙන්නං අමා.. ඔයාට පුලුවන් ඒව කියවලා මේ ෆීල්ඩ් එක ගැන තවත් අවබෝධයක් ගන්න.."

ජම්බු කොළ අතරින් පෙරී ආ නැවුම් හිරු රැස දහරක් ජනේලය තුළින් අමන්දි ගේ කැන්වසය මත පතිතව තිබුණේ ඒ මත වර්ණ රටාවක් මවමිණි. සිහින් මන්ද මාරුතය සමගින් සේපාලිකා මල් සුවඳක් පැතිරෙයි.

ජනේලයට ඔබ්බේ පියාඹමින් සිටි සමනළ රැණ දෙස අමන්දි බලා සිටියේ මහත් සතුටකිනි. ජීවිතය බොහෝ කෙටි ය. අසුරු සැනක් සේ කෙටි ය. එහෙත් එය සුන්දර නොවේ දැයි ඒ මොහොතේ ඇයට සිතුණි.

0000000000

අමන්දි නිල් සහ සුදු පැහැ එක්කර තැනූ ලා වර්ණයක් කැන්වසය මත ඇඳ තිබූ කඳු පෙළට ඉහළින් තැවරුවා ය. අඳුරු පැහැයෙ-න් නිමවී තිබූ කඳු වලට ඔබ්බෙන් පාව යන වළා පෙළක් ඇගේ සිතේ ඇඳී තිබුණි. ඈ උත්සාහ කරමින් සිටියේ ඒ මනස් සිත්තම කැන්වසය මත මවන්නට ය. ඒ උත්සාහය සියයට සියයක්ම සාර්ථක නැති වුව ද පින්සල් තුඩින් මැවුණ වළා පෙළ ඇගේ සිතේ සතුටක් ඇති කරන්නට සමත් විය.

මෙය අපූරු ව්‍යායාමයකි. භාවනාවක් සේ මනස එක්තැන් කරවන ව්‍යායාමයකි.

නිමන්තගෙන් පමණක් නොව දෙමව්පිය නෑදෑයින් මෙන්න හිත මිතුරන්ගෙන්ද තව තවත් ඈත් විය යුතු බව අමන්දි සිතයි. චිත්‍ර ශිල්පය හැදෑරීමටත්, භාවනා කිරීමටත් වැඩි වැඩියෙන් කාලය වෙන් කළ යුතු යයි ඈ තිර ලෙස අදිටන් කර ගත්තාය. තම සිත සමඟ නිතර පොරබදිමින්, සිතුවිලි හා ගැටෙමින් කල්පනා කිරීම සිතට කෙතරම් දරුණු වදයක්දැයි අමන්දිට සිතෙයි. ජීවිතය පිළිබඳ දැඩි කළකිරීමත්, ක්‍රමයෙන් සියල්ල අත්හැර දැමිය යුතු යයි යන සිතුවිල්ල තුළ සිතට දැනෙන සැහැල්ලුව පිළිබඳවත් සිතමින් ඕ බොහෝ දුර ගියාය.

ඉදිරි දොරේ සීනුව නාද වෙයි. ඒ දිලූපා විය යුතුය. අද අමන්දි හා ගත කිරීමට ඇය පැමිණෙන බව කීවේ ඊයේ ය. ඇගේ පැමිණීම සිතට සතුටක් ගෙන දෙනු ඇති බව නිසැක ය.

"ෂාහ්..කෙල්ල ආයෙත් අඳින්න පටන් අරන් තියෙන්නේ. නියමයි... ඩැරහ ටදදා අමා .. .. ජීවිතේ දිහා සුබවාදීව බලපන්.. හරිම ෂෝක් කොහොමත් උඹ චිත්‍ර අඳින්න හපනිනේ.." දිලූපා මහත් සතුටින් පවසයි. තම යෙහෙළිය මෙවැනි දෙයකට යොමුවීම පිළිබඳව දිලූපා ගේ සිතේ ඇති වන්නේ දැඩි සතුටකි. ... උඹ දන්නවද..? මං හරිම ආසයි අර කඳු පේළියටයි එහායින් පාවෙන වළාකුළු වලටයි.. උඹ ඒව හරිම ලස්සනට පාට කරලා තියෙනවා... හරිම තාත්විකයි..

කෙහෙල්මල .. අමන්දි මහ හඬින් සිනාසුණා ය .. කාටවත් ඇහෙන්න එහෙම කියන්න එපා.. චිත්‍ර රසවින්දනයෙදි උඹ කොයි තරම් දුර්වලද කියල හැමෝම දැනගනියි..

එක එක අය රස විඳින්නෙ එක එක හැටියට.. මම කියන්නෙ මගේ රසවින්දනය.. ඒක වෙන කෙනෙකුට වඩා ගොඩක් වෙනස් වෙන්න පුලුවන්..

අමන්දි නැවත සිනාසුණා ය.

අනේ මගේ හොඳ ළමයෝ.. ඔයා හැදුවෙ මගේ චිත්‍රයෙ නැති ලස්සනක් කියලා මාව සතුටු කරන්නයි.. හිතුවද මං මෝඩයි කියලා..? ම්.. මෝඩයි තමයි.. ඒත් උඹ හිතන තරම්ම නං මෝඩ නැහැ..



"අනේ නෑ අමා.. මං කිව්වෙ ඇත්ත ... අමා ඉස්සර කොච්චර නම් අඳිනවද..? උඹට කොළ කෑල්ලක් පේන්න බැහැනෙ, මොනවා හරිඅඳිනවා.. උඹ ඉතිං කොළයක් අරන් ඉරක් දෙකක් ඇන්ඳත් අපිට ඒක චිත්‍රයක්නෙ...."

අමන්දි දිලූපා ඉදිරියේ සිටගත්තා ය. ඇගේ දෑසග දිදුලණ කඳුලු අමන්දි හොඳින්ම දුටුවා ය. ඕ සිය යෙහෙළියගේ උරහිස මත සිය මුහුණ රඳවා ගත්තා ය. අමන්දි සුසුම් හෙළණු දිලූපා අසා සිටියා ය.

දිලූපා හමුවේ තම සිත විවර කර සිත සැහැල්ලු කරගන්නට අමන්දිට අවශ්‍ය විය. මේ පීඩනය කිසිවකු හමුවේ නිදහස් කළ යුතු බව අමන්දි දැන සිටියා ය. ඕ තම සිත තුළ ගොඩ ගසා ගෙන සිටි හැඟීම් තම මිතුරීය ඉදිරියේ ඔහේ ගලා යන්නට දී බලා සිටියාය. සුවිසල් බරක් ක්‍රමයෙන් සිය සිත තුළ ගොඩ ගැසෙණු දිලූපාට දැනුණි.

00000000000000000000

නිමන්ත නිවසට පැමිණියේ බෑග් කිහිපයක් ද අතැතිව ය. අමන්දිට චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය උපකරණ කිහිපයක් ද, චිත්‍ර ශිල්පය පිළිබඳව ඉංග්‍රිසියෙන් ලියැවුණු පොත් කිහිපයක්ද ඒ අතර විය.

"ඔයාට මේවායින් ප්‍රයෝජනයක් වෙයිද මන්දා..." ඔහු කීවේ පොත් කීපය අමන්දි අතට දෙන අතර ය.

"තේරුමක් නැතිව මහන්සි වෙලා..." අමන්දි කීවේ අසතුටෙනි. උවමනාවට එපාවට මෙන් පොතක් දෙකක් පෙරළා බැලූ ඇය ඒවා මේසය මත තැබුවා ය. නිමන්ත තමා වෙනුවෙන් වෙහෙස වීම නොකළ යුතු දෙයකැයි අමන්දිට දැන් දැන් සිතෙයි.

ඇගේ වචනත් හැසිරීමත් නිමන්තගේ සිතේ ඇති කළේ කෝපයකි. අතේ තිබූ ඉතිරි බෑග් කීපය පුටුවක් මතට දැමූ ඔහු කමිසය ගලවමින් සිය කාමරයට වැදුණේ ය.

කමිසය ගලවා පුටුවක් මතට විසි කළ නිමන්ත ඇඳේ ඇල වුණේ ය. දෑස් පියා ගත් ඔහු බිඳුණු සිත එකලස් කරගන්නට තැත් කළේ ය.

අමන්දි වෙනුවෙන් සාප්පු ගානේ ඇවිද සවස් වරුවම නාස්ති කිරීම පිළිබඳ ඔහු පසුතැවුණේ ය. මේ පොත් කීපය සොයා ගන්නට පොත් සාප්පු කීයකට නම් ගියා ද? මේ සියල්ල තමා කළේ කොපමණ උද්යෝගයකින් ද? ඒ සියල්ල කළේ කොයි තරම් කැපවීමකින් ද?. ආසාවකින් ද?. අමන්දි ඒ මහන්සිය තඹ සතයකට හෝ මායිම් නොකිරීම මහත් කණගාටුවකි.

අමන්දි හා කෝප විය යුතු නැතැයි ඔහුගේ යටි සිත කියයි. ඇයට අනුකම්පා කළ යුතු ය. මේ හැඟීම් වලට නොව බුද්ධියට ඉඩ දිය යුතු මො-හොතක් බව සැබෑ ය. එනමුදු ඇගේ මේ අසාමාන්‍ය හැසිරීම විසින් ඔහු සිතේ ඇති කරන ලද අප්‍රසන්න බව නැති කරන්නට බුද්ධියට හැකියාවක් නැති බව ඔහුටම වැටහෙයි.

000000000

"දොස්තර මහත්තයා... ඇතුළට එන්ඩ අවසරයි ද..?" මිලින්ද ගේ කාමරයට එබී බැලූ චතුරි ඇසුවා ය. කරමින් සිටි කාර්යය නවතා හිස එසවූ මිලින්ද සුන්දර යුවතිය දෙස මහත් සතුටකින් බලා සිටියේ ය.

"ඇතුළට එන්න කියන්නැද්ද..?" චතුරි දොර අසළ සිට ම නැවත ඇසුවා ය.

"පිස්සු ද..? එනවා ඇතුළට.." ඔහු කීවේ තරවටු කරන්නා සේ ය.

ලියමින් සිටි ලියවිල්ල නතර කර පෑන ද වසා දැමූ මිලින්ද පුටුව පසු පසට කර ගනිමින් තමාගේ මේසය ඉදිරියෙන් වූ අසුනේ සීරුවෙන් වාඩි වන චතුරි දෙස බලා සිටියේ ය.

"ඉතින්.." ඔහු ඇසුවේ කතාව කොතැනින් අරඹන්නදැයි සිතා ගත නොහැකිව ය. පිලිතුරක් ලෙස ඇය කිසිවක් නොකීවා ය. ඔහු ඇගේ බරැරුම් බැල්ම මගහැර බිත්තියේ එල්ලා තිබූ සිත්තම දෙස බැලුවේ ය. "ඔයා කියාපු හැම දෙයක්ම මම හිතලා බැලුවා.. මටත් හරිම කණගාටුයි චතූ .. ඒත් මට අක්කගෙ ලෙඩේ ගැන රිපෝර්ට්ස් ටික බලන්නෙ නැතිව හරියටම යමක් කියන්න බැහැ.. ඩොක්ටර් සිරිමාන්න ඒ විදිහේ නිගමනයකට ආවා නම් ඒකෙ ආයෙ වැරදීමක් වෙන්න තියෙන ඉඩ හුඟාක් අඩුයි.. එයා මේ ෆීල්ඩ් එකේ ඉන්න හොඳම ස්පෙෂලිස්ට්.. "

චතුරි මේසය මතින් දෑස් ඉවත් කර මිලින්ද දෙස බැලුවා ය. සිය දෙනෙතේ පිරී තිබූ කඳුළු ඔහුගෙන් වසන් කරන්නට ඈ උත්සාහ නොකළා ය. යමක් කියන්නට ඇගේ දෙතොල් වෙවුළණු ඔහු දුටුවේ ය. ඔහු මේසය හරහා ඇදී ඇගේ දෑත් සිය දෑතට ගුලි කර ගත්තේ ය.

"අඬන්න එපා... " ඔහු පහත් හඬින් කීවේ ය.

චතුරි ඔහුගේ දෑත් මත සිය හිස තබා ගත්තා ය. ඇගේ කඳුළු ඔහුගේ ඇඟිළි මත තැවරුණි. ඔහු ඇයට හඬන්නට ඉඩ හැර බලා සිටියේ ය.







"චතූ ... මේ අහන්න.. මේ වෙලාවෙ හොඳම දේ තමයි පොසිටිව් වෙලා ඉන්න එක... බලාපොරොත්තු නැති කරගන්නෙ නැතිව කරගෙන යන ට්‍රීට්මන්ට්ස් ගැන බලාපොරොත්තු තියා ගමු.. " ඔහු කීවේ ඇය හිස එසවූ පසුව ය.

"එහෙම නෙවෙයි.. ඔයාට පුලුවන් නේද මේක ගැන ඩොක්ටර් සිරිමාන්න එක්ක කතා කරන්න..? තව හොයලා බලන්න..?" ඇය කතා කරද්දී ඔහු ඇගේ රතු වූ දෑස් දෙස බලා සිටියේ ය. ".. එතකොට ඒ අය තවත් මේ ගැන උනන්දු වෙයි.. මම කියන්නෙ නැහැ ඒගොල්ලො දැනට උනන්දු නැහැයි කියලා.. ඒත් ඔයත් මේකට සමබන්ධ වුණොත් වඩාත් උනන්දු වෙයි නේද..?"

"මම කතා කරන්නම්.. අදම කතා කරන්නම්.. " ඔහු තිර ලෙස කීවේ ය.

"සමහර විට ලංකාවට තාම ආවෙ නැති ට්‍රීට්මන්ට්ස් අලුත් බෙහෙත් වර්ග එහෙම ඕනෙ තරම් ඇති.. ඒව ගැන අනේ හොයල බලන්න මිලින්ද.. අපි කොහෙ-ාමද අපේ අක්කා නැති වෙනවා බල බල නිකම් ඉන්නෙ..? අපිත් මොනවා හරි කරන්න ඕනෙ නේද..? සල්ලි ගැන හිතන්න එපා.. අපේ තියෙන ඔක්කොම විකුණලා හරි වියදම් කරන්න ලෑස්තියි තාත්තා.."

"මං බලන්නම් චතූ.. ඔයා දුක්වෙන්න එපා.. අපි බලමු.. පොඩි ඉඩක් හරි හොයාගන්න බලමු.."

මතු සම්බන්ධයි